එම්. බී. මල්සිංහ
29 SEP 1997

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1997 අංක 16 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1997 ජූලි මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 ජූලි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 3.40 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

## 1997 අංක 16 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 ජූලි මස 22 වන දින.]

එල්. ඩී.–ඕ. 23/90.

1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1997 අංක 16 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. 1985 අංක 19 දරන පනතින් සංශෝධිත, 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 3 වන වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 1983 අංක 24 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(6) සෑම නිලධාරිනියක ම විසින් මේ උපවගන්තිය ක්‍රියාත්මක වීමේ දින සිට මාස හයක් ඇතුළත, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වීමට තීරණය කළ යුතු ය. මේ උපවගන්තිය ක්‍රියාත්මක වීමේ දිනයට කලින් ඒ නිලධාරිනිය මියගොස් ඇති අවස්ථාවක හෝ දායිකාවක වීමට තීරණය කිරීමට ඇයට හැකිව තිබූ කාලසීමාව ඉකුත් වීමට පෙර හෝ නිලධාරිනිය මියයන අවස්ථාවක, ඒ මරණයෙන් පසු ඇගේ ස්වාමි පුරුෂයා හෝ දරුවකු හෝ ස්වාමි පුරුෂයා සහ දරුවකු හෝ ස්වාමි පුරුෂයා සහ දරුවන් ජීවත්ව සිටින්නේ නම්, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වීමට ඇය තීරණය කොට තිබුණ ලෙස සලකනු ලැබිය යුතු ය."

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—D042312—5,900 (96/11)

පාර්ලිමේන්තුවේ සිංහල හැන්සාඩ් කෙටුම්පත්වල සහ වාරවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා ඉදිරි එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.